# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/3 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥපනත (40 අධි.)**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥපනතෙහි 5 වෙන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 දින,
නුවරඑළියේ දී ය.

**1975 අංක 4 දරන හදිසි අවස්ථා (බන්ධනාගාරවලින් පුද්ගලයන් මුදාහැරීම) නියෝග**

නියෝගවල අදාළත්වය.

1. මෙම නියෝගවල විධිවිධාන—

(අ) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද බලපානු ඇත ;

(ආ) හදිසි අවස්ථා නියෝග කිසිවක් යටතේ යම් වරදක් කිරීම නිසා, සැකකරන ලැබූ, චෝදනා ලැබූ හෝ වරදකරුවකු කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකු සම්බන්ධයෙන් අදාළ නොවේ ;

(ඇ) හදිසි අවස්ථා නියෝග කිසිවක් යටතේ සිරභාරයෙහි රඳවා ගන්නා ලද කිසියම් පුද්ගලයෙකුට අදාළ නොවේ.

රිමාන්ඩ් බන්ධනාගාරගතකරනු ලැබූ පුද්ගලයන් අධිකාරිවරයා විසින් පුද්ගලික බැඳුම්කරයක් උඩ නිදහස් කළ හැකිය.

2. (1) පුද්ගලයෙක් ඇප දිය හැකි වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ විට එම පුද්ගලයා—

(අ) අධිකරණය මගින් සිර භාරයේ තැබූ විට, හෝ

(ආ) ඇප නියම කළ ද, ඔහුට ඇප තැබීමට නොහැකිවීම හෝ වෙනත් හේතුවක් නිසා අධිකරණය මගින් සිර භාරයේ තැබූ විට, හෝ

එවැනි පුද්ගලයෙකු අධිකරණය ඉදිරියේ පෙනීසිටීම සඳහා ඇපකාරයන් නොමැතිව බැඳුම්කරයකට අත්සන් කළ විට එම පුද්ගලයා ඇතුළත් කරගනු ලැබූ බන්ධනාගාරයේ අධිකාරිවරයා විසින් තමන්ගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී ඔහු බන්ධනාගාරයෙන් නිදහස් කළ හැකිය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් කරනු ලැබූ බන්ධනාගාර අධිකාරිවරයාගේ බලතල, ලේකම්ගේ විශේෂ හෝ සාමාන්‍ය නියමයන්වලට යටත්ව පාවිච්චි කළ යුතුය.

දඬුවම අත්හිටවීම සහ ලිහිල් කිරීම.

3. (1) පුද්ගලයකු විසින් අධිකරණයක් මගින් නියම කරනු ලැබූ සිරදඬුවමකින් කොටසක් විඳ තිබූ විට—

(අ) එවැනි දඬුවම අත්හිටවීමට, හෝ

(ආ) එවැනි දඬුවමෙන් ඉතිරි කොටස හෝ එයින් කොටසක් ලිහිල් කිරීමට හෝ ලේකම් විසින් නියම කිරීම නීත්‍යානුකූල වේ.

(2) මෙම නියෝගයේ (1) ඡේදයේ විධිවිධාන, දඬුවම අත්හිටවීම හෝ ලිහිල් කිරීම සම්බන්ධයෙන් වෙනත් අයෙකුගේ අයිතිවාසිකම් හෝ වෙනත් නීතියක බලතල හීන කිරීම සඳහා හෝ නොව ඊට අතිරේකව විය යුතුය.

අර්ථ නිරූපණය.

4. මේ නියෝගයන්හි—

බන්ධනාගාරයක "අධිකාරිවරයා" යන්නෙහි යම් සහකාර අධිකාරිවරයෙක් ද ඇතුළත් වේ ;
"ලේකම්" යන්නෙහි අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

27A—ජ 13567—8,100 (75,04)